Australian Government
Department of Immigration and Citizenship

## ලියාපදිංචි නොවූ සංක්‍රමණ නියෝජිතයන් උපයෝගී කර ගැනීමට පෙළඹෙන්න එපා

ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයෙකු නොවන කිසිවෙකු විසින් සංක්‍රමණ උපකාර ලබාදීම නීතිවිරෝධී බව ඔබ දැන සිටියේද?

මෙය නීතිවිරෝධී වීමට හේතුව වන්නේ සැක නොකරන අය වෙත වැරදි උපදෙස් ලබාදීම මගින් ආරක්‍ෂා කිරීම හෝ සංක්‍රමණ උපදෙස් වෘත්තීකයන් වශයෙන් පෙන්වන දූෂ්ට ලෙස කටයුතු කරන අය වෙත මුදල් ගෙවා සිය මුදල් නැතිවීම වැළැක්වීමය.

ඕස්ට්‍රේලියාවේ සංක්‍රමණික නියෝජිතයන් විසින් සංක්‍රමණ නියෝජිත ලියාපදිංචි අධිකාරී කාර්යාලයේ (Office of the Migration Agents Registration Authority (MARA)) ලියාපදිංචි විය යුතුය. සංක්‍රමණ උපකාර ලබාදෙන ලියාපදිංචි නොවූ අය (ගාස්තුවක් අය නොකලද) නීතිය කඩ කරන අතර වසර 10 ක් තෙක් සිර දඬුවමකට යටත් විය හැක.

ලියාපදිංචි නොවූ සංක්‍රමණ නියෝජිතයන් උපකාර කර ගැනීම අධෛර්‍ය කිරීමට සංක්‍රමණ සහ පුරවැසි දෙපාර්තමේන්තුව (Department of Immigration and Citizenship (DIAC)) ඇපකැපවී සිටී. පසුගිය වසරේ ලියාපදිංචි නොවූ සංක්‍රමණ නියෝජිතයකු හට දඬුවම් කිරීම නීතිවිරෝධී ලෙස කටයුතු කරන අය හට ලබා දූන් හොඳ අනතුරු හැඟවීමක් වන අතර ඔවුන් විසින් ඉතා ඉහල අවදානමක් දරන අතර ඔවුන්ව නීතියේ රැහැනට හසුවනු ඇත. ලියාපදිංචි නොවූ නියෝජිතයකු වශයෙන් සංක්‍රමණ කටයුතු සම්බන්ධයෙන් මිනිසුන් නියෝජනය කර වැරදි ලෙස මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් මෙම අය හට වසර දෙකක සිරදඬුවමක් නියම විය.

පසුගිය වසර කිහිපය පුරා ජීවත් වීමට, සංචාරය කිරීමට, ඉගෙන ගැනීමට හෝ වැඩ කිරීමට පැමිණි වාර්තාගත මිනිසුන් සංඛ්‍යාවක් ඕස්ට්‍රේලියාව විසින් පිළිගනු ලැබ ඇත. අපගේ සංක්‍රමණ වැඩසටහන් ලොව ඇති හොඳම වැඩසටහන්වලින් එකක් වුවද, වීසා බලපත්‍ර සම්බන්ධයෙන් ඇති අවශ්‍යතා දැඩි අතර රීතීන් සංකීර්ණ විය හැක.

තමන් හට උපකාර ලබා ගැනීම සඳහා සංක්‍රමණ නියෝජිතයෙකුගේ සහාය ලබා ගැනීම අවශ්‍ය බව සිතිය හැකි අතර මොවුන් විසින් තමාගෙන් අයුතු ලාභ ලබා නොගන්නා බවට ප්‍රවේසම් විය යුතුය. යම් අයෙකු විසින් සංක්‍රමණ නියෝජිතයකු උපකාර කර ගන්නේ නම්, ඔවුන් ලියාපදිංචිවී ඇති බවට වග බලා ගත යුතුය.

සිය ඕස්ට්‍රේලියානු වීසා බලපත්‍රය සඳහා ඕනෑම අයෙකු හට අයදුම් කල හැකි අතර සංක්‍රමණ නියෝජිතයකු හට මෙම අයදුම්පත්‍රයක ප්‍රතිඵලය වෙත බලපෑම් කල නොහැක. කෙසේවුවද, ඔබට මෙය තනියෙන් කර ගත හැකි බවට විශ්වාසයක් නැතිනම් හෝ, ඔබගේ අයදුම්පත්‍රය සංකීර්ණ නම්, ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයකුගේ සහාය ලබා ගැනීමට ඔබ විසින් තීරණය කල හැකිය. සංක්‍රමණ නියෝජිතයකුව තෝරා ගැනීමට පෙර, හොඳින් සොයා බලන්න. පාරිභෝගිකයකු වශයෙන් ඔබට ඇති ශක්තිමත්ම ආරක්‍ෂාව නම්, ලියාපදිංචි සංක්‍රමණ නියෝජිතයන් විශාල සංඛ්‍යාවක් අතරින් තමාට අවශ්‍ය අයව ප්‍රවේශමෙන් තෝරා ගැනීමවේ.

සංක්‍රමණ නියෝජිතයකු තෝරා ගැනීමේදී පහත කරුණු සැලකිල්ලට ගන්නඃ

" ඔවුන් ලියාපදිංචිවී ඇති බව සහ ඕස්ට්‍රේලියාවේ නීත්‍යානුකූලව ක්‍රියාත්මක විය හැකිද යන බව. www.mara.gov.au හි MARA කාර්යාලයේ වෙබ් අඩවිය වෙත යන්න, නැතිනම් දූරකථන අංක 1300 22 62 72 ඔස්සේ කාර්යාලය අමතන්න
" ප්‍රශ්න ඇසීමට බිය නොවන්න. කිසි දෙයක් උපකල්පනය නොකරන්න
" තීරණය කිරීමට පෙර මිල ගණන් දෙක තුනක් ලබා ගන්න
" www.mara.gov.au හි ඇති සංක්‍රමණ නියෝජිතයන්ගේ හැසිරීම් සංග්‍රහය (Code of Conduct) බලන්න.

සංක්‍රමණ නියෝජිතයාගෙන් පහත ආකාරයේ ප්‍රශ්න අසන්නඃ

" මෙම රැකියාවේ කොතෙක් කල් ඔබ සේවය කර ඇතිද?
" මට උපකාර අවශ්‍ය ක්ෂේත්‍රයේ ඔබට ඇති අත්දැකීම් මොනවාද?
" ඔබ මා හට ලබාදෙන සේවා මොනවාද?
" ඒ සඳහා යන වියදම කුමක්ද?

ඔබගේ සංක්‍රමණ නියෝජිතයා සමග යම්කිසි ගැටළු ඇතිනම්, ග්‍රුං කාර්‍යාලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකිය. දරුණු වැරදි සම්බන්ධයෙන් කාර්‍යාලය මගින් ඔවුන්ගේ ලියාපදිංචිය ඉවත් කල හැකිය.

ලියාපදිංචි නොවූ නියෝජිතයකුගේ සහාය ලබා ගැනීමෙන් සිදුවිය හැකි අනතුරු සම්බන්ධ වැඩිපුර සාක්ෂි අවශ්‍ය නම්, සැක නොකල සේවාදායකයකු හට සිදුවූ දෙය දැක බලා ගැනීමට "Don't get caught out!" වීඩියෝ පටය දෙපාර්තමේන්තුවේ IMMItv මගින් www.youtube.com/watch?v=_RacpuZ3NQ0 හි බලන්න.

28 වන පිටෙන්

වැඩ කර"කර ඉන්නවා." පින් හිනා වුණා.

"මොකද දන්නැත්තේ ? මං දකිනවා වෙබ් සයිට්වල උඹලගේ සිල්ලර වැඩ. ඒ දවස්වලත් උඹලා කලේ සිල්ලරට කරපු වැඩනේ. "උඹලා මං මුලින් දැක්කෙ නැත්තෙ ? කොහෙද උන්නේ ?"

"අපි ආවේ විවේකයේදී ?" අර ජගත්ගේ වැඩේට ගියානේ. දන්නවානේ ජගත්ව ?"

"ඔව් ඔව් අර එස්.ඩී. ඇන්ඩ් සී. සී. එකෙයි ආර්.ඩී.ඒ. එකෙයි උන්නු මිකෑනිකල් ඉන්ජිනියර් නෙ. මං දකින්වා ජගත්ගේ වැඩත් වෙබ් එකේ. කොහොමද ඒ වැඩේ.?"

"හොඳට ගියා. ජගත්ගෙ කවි සිංදු ගැන ටිකක් තව කතා කළා නම් හොඳා වගේ." පන් කිව්වා. " එයා ලංකාවෙදි වුණාත් එළියට ආවේ කවියෙන් කියලයි මට හිතෙන්නෙ..."

"ඒක නෙවි; මාත් ඔහෙට මයිග්‍රේට් වෙන්නයි හිතං ඉන්නේ...."

"මරුනේ ! වරෙන් අපිත් එක්ක ගපේ ගහන්න. පින් ඉස්සර වුණා.

"ඔව් ඉතින් උඹලගෙ ඔය සිල්ලර වැඩවලට මාවත් ගාවන්න හිතාගෙන වෙන්න ඇති. මං නොදන්නවායැ උඹලා ජෝඩුව ගැන."

"ඇත්තටම අපි කලා බර වෙලා කතාකරනකොට අපෙන් ලොකුවට ම මඟ ඇරෙන පැත්තක් තියෙනවා. උඹට පුළුවන්නේ අපිව දැනුවත් කරන්න. ?"

"අර යාළුවාවත් මං අඳුන්නලා දෙන්නං. මං යූ. කේ. ගිහින් ආපහු එනකප් එයාත් උඹලට උදව් කරයි. සිවිල් ඉංජිනියරිං පැත්ත ගැන වර්ල්ඩ් වයිඩ් නොලෙජ් එකක් දේවි. හැබැයි මට හිතෙන්නෙ මෙතන ඒකට තැන නෙවි."

බර කතාවක උන්නු යාලුවා දිහා බල බල පන් කිව්වා.

"අපි වෙනම ම ඇපොයින්මන්ට් එකක් දාගෙන මං යන්න කලියෙන් අඳුනාගමු."

"ලොකු දෙයක් මචං !" පන්, පින් දෙන්නට හරි සතුටුයි. කට්ටියම දුරකථන අංක හුවමාරු කරගත්තා.

"උඹ ඩිසයින් කරපු අර ලංකාවේ මුල්ම ඉන්ටර්චේන්ජ් එකේ ස්කෙච් එක ඊ මේල් කරපන්කො සන්නසට " යවන්න." පින් පැන්ගෙන් ඉල්ලුවා.

"මච්බිමේ මුල්ම වතාවට "මංමාරුවක් සැළසුම් කළේ පැන්. පාරවල් දෙකක් එකට කැපෙන මංසන්ධිකට කියන්නෙ ඉන්ටර්සෙක්ෂන් (INTER-SECTION) කියලා. අපි මෙහේ එක්සිට් (EXIT) කියලා කියන ෆ්‍රීවේ (Freeway) වලදි පාරවල් නොකැපී ඇතුල් වෙන්න පිටවෙන්න පහසුකම් තියෙන ඉන්ටර්චේන්ජ්වලට (INTERCHANGE) අපිට නමක් කියන්නයි වෙලා තියෙන්නෙ.

"මං හිතන්නෙ අපිට ඒකට මංමාරුව කියලා නම තියන්න පුළුවන්...." පන් යෝජනා කළා.

පැන් මේ මංමාරුව සැළසුම් කළේ කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ (EXPRESS-WAY) පෑලියගොඩ ප්‍රදේශයටයි. තවම මේ මාර්ගය ඉදි නොවුණාත් ශ්‍රී ලංකාවේ මාර්ග සැළසුම් ක්ෂේත්‍රයේ නොමැකෙන ජාතික මං සළකුණක් (REMARKABLE NATIONAL ACHIEVEMENT) විදියට පැන්ට වටිනා සහතිකයක් පිරිනැමුණා. සැළසුමක් වෙනුවෙන් දැන් ඉදිරිකරීම් කටයුතු පටන් ගන්න යන බවයි ආරංචියි.

"ඇත්තටම පැන් ආය ආවම ඒ දේවල් ගැන කතා කරන්න පුළුවන්. අපි අපේ ලිපිය එක්ක මංම-ාරුවේ ත්‍රිමාන සටහන දාන්නම් දැනට" පින් කිව්වා. "අපේ ගමනේත් "මංමාරුවක්" වේවි මේ හමුවීම."

"හරි එහෙනං. මෙන්න අපි ගියා." පැන් යාලුවත් එක්ක සෙනඟ අතරින් නොපෙනී ගියා.

■

ABN 399 885 48425

SRI WRECK
TOWING



VEHICLE TRANSPORT
BREAKDOWNS
FREE OLD CAR REMOVALS
RELIABLE RATES
TILT TRAY TRUCK
ALL AREAS

24 hours 7 days a week
0433 495 548
udesha@bigpond.com Tel 5995 6105